187

29

Legal
Could you pl. let the English version amended, as discussed.

done

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 591/18—1990 ජනවාරි 05 වැනි සිකුරාදා—1990.01.05

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරණ ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.-බී. 21/78 II

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1989 අංක 3 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධිත, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 23 (2) වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය.,
වැඩබලන ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1989 දෙසැම්බර් මස 27 දින,
කොළඹ දී.

**නියමාවලිය**

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ නියමාවලිය 1990 අංක 1 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 1990 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වේ.

1987 අංක 1 දරන නියමාවලිය ඉවත් කිරීම. විවෘත විශ්වවිද්‍යාලය පිහිටුවීම

2. 1987 මාර්තු මස 27 වන දින අංක 446/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1987 අංක 1 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලිය ඒ යටතේ කර ඇති යම් දෙයකට හානියක් නොමැතිව, මෙයින් ඉවත් කරනු ලැබේ.

3. (1) 1980 මැයි 8 වන දින අංක 87/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 23 (1) වන වගන්තිය යටතේ සාදන ලද විවෘත විශ්වවිද්‍යාල නියමය ක්‍රියාත්මක වූ විට, (මෙහි මින් මතු " විවෘත විශ්වවිද්‍යාලය " යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, පනතේ 28(1) වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාලයක් වෙත පවරන ලද හෝ දෙන ලද බලයට හෝ අධිකාරයට අනුකූල සියලු දේ එම විශ්වවිද්‍යාලය මගින් හෝ ඒ නමින් කිරීම ට සම්පූර්ණ බලය හා අධිකාරය ඇතිව විශ්වවිද්‍යාලයක් ලෙස පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ ඡෙදයේ ඉහතින් වූ විධිවිධාන මගින් විවෘත විශ්වවිද්‍යාලය වෙත පිරිනමනු ලැබූ බලතල, මේ නියමාවලියෙන් හෝ වෙනත් යම් කිසි සාධක පත්‍රයකින් වෙනත් ආකාරයකට ප්‍රකාශිතවම විධිවිධාන ලබා ඇතහොත් මිස, එහි සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

15 JAN 1990

විවෘත විශ්වවිද්‍යාලයේ බලතල

4. පනතේ විධිවිධානවලට, විවෘත විශ්වවිද්‍යාල නියමයට හා කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍යවලට යටත්ව, පහත සඳහන් කටයුතු කිරීම විවෘත විශ්වවිද්‍යාලයට බලය ඇත්තේ ය —

(අ) ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම ;

(ආ) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව විවෘත විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලැබූ අධ්‍යයන ක්ෂේත්‍රයක හෝ ක්ෂේත්‍රවල ඉගැන්වීමේ කටයුතු සැලැස්වීම සහ ඒ කාර්යය සඳහා විවෘත විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකින් ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් අධ්‍යාපන ආයතන හෝ බලධරයන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ඇ) විවිධ අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කොට දැන ගැනීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම ;

(ඈ) විවෘත විශ්වවිද්‍යාලයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමග, ආචාර්යවරුන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ඉ) අතුරු ව්‍යවස්ථා වලින් නියම කොට ඇති විවෘත විශ්වවිද්‍යාලයේ විභාග වලින් සමාර්ථ ලැබුවා වූ තැනැත්තන් වෙත උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම හා පිරිනැමීම ;

(ඊ) විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් නිර්දේශ කරනු ලැබ, එහි පාලක සභාව විසින් අනුමත කරන ලද තැනැත්තන්ට සම්මාන උපාධි හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනැමීම ;

(උ) විවෘත විශ්වවිද්‍යාලයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ විවෘත විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් වෙනත් අධ්‍යාපන ආයතනවලදී සාමාර්ථය ලත් විභාග සහ ගත කළ අධ්‍යයන කාල සීමා අතුරු ව්‍යවස්ථා වලින් නියම කොට ඇති පරිදි විවෘත විශ්වවිද්‍යාලයේ එවැනි විභාග වලට හා එවැනි අධ්‍යයන කාලසීමාවලට හෝ ඉන් යම් කොටසකට සමාන ලෙස පිළිගැනීම හා ඕනෑම අවස්ථාවක ඒ පිළිගැනීම ඉවත් කර ගැනීම ;

(ඌ) විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර හා වෙනත් ගොඩනැගිලි, ඉගැන්වීමේ හෝ පදිංචිවීමේ කාර්ය සඳහා ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වාගෙන යාම ;

(එ) මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු හෝ කථිකාචාර්ය තනතුරු හා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් තනතුරු ඇති කිරීම කොමිෂන් සභාවට නිර්දේශ කිරීම ;

(ඒ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව ඡාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ආදිය ඇති කිරීම හා ප්‍රදානය කිරීම ,

(ඔ) විවෘත විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ, ආචාර්යවරයන්ගේ, නිලධරයන්ගේ සහ වෙනත් සේවකයන්ගේ වාසය, විනය සහ ශුභ සිද්ධිය විධිමත් කිරීම සහ ඒ සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඕ) නේවාසිකාගාර පිහිටුවා පාලනය කිරීම, ශිෂ්‍යයන්ට නේවාසික පහසුකම් සලස්වන වාසස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ විවෘත විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ වාසය පිණිස අවශ්‍ය විය හැකි වෙනත් එවැනි සේවා හා පහසුකම් සැලැස්වීම ;

(ක) අතුරු ව්‍යවස්ථා වලින් විධිවිධාන සලස්වා ඇති පරිදි මහජනයා උදෙසා ව්‍යාප්ත සේවා හා සේවාස්ථ පාඨමාලා ලබා දීම ;

(ග) පාඨමාලාවල කොටස්, විවෘත විශ්වවිද්‍යාලයෙන් බාහිර වූ අධ්‍යාපන ආයතනවල පැවැත්වීමට කටයුතු ඒ සඳහා විධිවිධාන සලස්වන යම් අතුරු ව්‍යවස්ථාවක් අනුව පිළියෙල කිරීම ;

(ච) අතුරු ව්‍යවස්ථාවකින් නියම කොට ඇති කොන්දේසි යටතේ ගාස්තු ඉල්ලීම හා භාර ගැනීම ;

(ජ) විවෘත විශ්වවිද්‍යාලයේ පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි ඉහත සඳහන් බලතලවලට අනුෂාංගික වූ හෝ නොවූ වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

*කුලපතිවරයා*

5. ජනාධිපතිවරයා විසින් විවෘත විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා නම් කළ යුතු ය. කුලපතිවරයා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රධානයා වන අතර තම නම් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු පහක කාලසීමාවක් ඔහු විසින් ඒ ධූරය දරන්නේ ය. තව ද, පැමිණ සිටින විට ඔහු විවෘත විශ්වවිද්‍යාලයේ යම් උපාධි ප්‍රදනෝත්සව යක මුලසුන දරන්නේ ය.

*විවෘත විශ්වවිද්‍යාලයේ නිලධරයෝ*

6. පහත සඳහන් තැනැත්තෝ විවෘත විශ්වවිද්‍යාලයේ නිලධරයෝ වන්නාහ :—

(අ) උප කුලපතිවරයා ;

(ආ) නියෝජ්‍ය උප කුලපතිවරයකු වෙතොත් ඔහු;

(ඇ) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(ඈ) අධ්‍යාපන තාක්ෂණ අධ්‍යක්ෂවරයා ;

(ඉ) ප්‍රාදේශීය අධ්‍යාපන සේවා අධ්‍යක්ෂවරයා ;

(ඊ) ලේඛකාධිකාරිවරයා ;

(උ) පුස්තකාලයාධිකාරිවරයා ;

(ඌ) මූල්‍යාධිකාරිවරයා ; සහ

(එ) තනතුරක් හැටියට කොමිෂන් සභාව විසින් අනුමත කොට ඇති යම් තනතුරක් දරන්නා වූ ද, මේ ඡෙදයේ කාර්ය සඳහා ඒ තනතුර දරන්නා නිලධරයකු වන්නා වූ ද තැනැත්තා.

*උප කුලපතිවරයා*

7. (1) (අ) විවෘත විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා, ඒ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නිර්දේශිත නම් තුනකින් යුත් මූල මණ්ඩලයකින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(ආ) විවෘත විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා, කොමිෂන් සභාව විමසීමෙන් පසු ජනාධිපතිවරය විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) උපකුලපතිවරයා විවෘත විශ්වවිද්‍යාලයේ පූර්ණ කාල නිලධරයකු වන අතර, ඔහු එහි ප්‍රධාන විධායක හා ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු නිල බලයෙන් පාලන සභාව සහ සනාතන සභාව යන සභා දෙකෙහිම සාමාජිකයකු සහ සභාපතිවරයා වන්නේ ය. විවෘත විශ්වවිද්‍යාලයේ වෙනත් යම් බල මණ්ඩලයක නැතහොත් මණ්ඩලයක යම් රැස්වීමක් කැඳවීමට, එහි පැමිණ සිටීමට හා එහි දී කථා කිරීමට ඔහුට හිමිකම් ඇති නමුත්, ඒ වෙනත් යම් බලමණ්ඩලයේ හෝ මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස එකී යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැත්තේ ය.

(3) පාලන සභාව විසින් කලින් කල නීත්‍යානුකූලව තමා වෙත නිකුත් කරනු ලබන විධාන අනුව, පනතෙහි සහ යම් උචිත සාධන පත්‍රයක විධි විධාන, විවෘත විශ්වවිද්‍යාලයට අදාළ වන තාක් දුරට, යථා පරිදි පැදීම ගැන වගබලා ගැනීම උප කුලපතිවරයාගේ කාර්යය වන්නේ ය. තව ද ඒ කාර්යට අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහු සතු අතර, ඒ බලතල ඔහු විසින් ක්‍රියාත්මක කළ හැකි ය.

(4) පනතේ සහ මේ නියමාවලියේ විධිවිධානවලට යටත්ව, පාලක සභාවේ සහ සනාතන සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම උප කුලපතිවරයාගේ කාර්යය වන්නේ ය.

(5) උප කුලපතිවරයා විවෘත විශ්වවිද්‍යාලයේ ගණන් දීමේ නිලධරයා වන්නේ ය.

(6) උප කුලපතිවරයා පහත දැක්වෙන දේ සම්බන්ධයෙන් වගකිව යුතුය :—

(i) විවෘත විශ්වවිද්‍යාලයට අදාළව පාලක සභාව විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීම සහ එකී ප්‍රතිපත්තිවලට යටත්ව, විවෘත විශ්වවිද්‍යාලයේ පරිපාල නය ඇතුළුව එහි කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම ; සහ

(ii) විවෘත විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වාගෙන යාම.

(7) උප කුලපතිවරයා, ඔහු කලින් ධූරය අත්හැර ගියහොත් හෝ මේ ඡෙදයේ (1) වන අනුඡෙදයෙහි (ආ) වන වගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාල සීමාව හෝ ඔහුට වයස අවුරුදු හැට පහ සම්පූර්ණවීම යන මේ දෙකින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ඔහු ධූර දැරිය යුතු ය.

(8) නිවාඩු පිට සිටීම, රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනයම් හේතුවක් නිසා හෝ තම ධූරයේ කටයුතු ඉටු කිරීමට උප කුලපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත්, නියෝජ්‍ය උප කුලපතිවරයකු සිටී නම් ඒ නියෝජ්‍ය උප කුලපතිවරයා විසින් එකී කාර්ය ඉටු කරනු ලැබිය යුතුය. නියෝජ්‍ය උප කුලපතිවරයකු නොමැති අවස්ථාවක දී, එකී ධූරයේ කටයුතු කරගෙන යාම සඳහා සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙලක්, එකී අශක්නුතාව සිදු වී දින හතක් ඇතුළත දී කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය.

(9) උප කුලපතිවරයාගේ ධූරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, මේ ඡේදයේ ඉහත සඳහන් විධි විධාන යටතේ ස්ථිර පත්වීමක් කරනු ලබන තෙක් —

(i) නියෝජ්‍ය උප කුලපතිවරයකු සිටී නම්, ඒ නියෝජ්‍ය උප කුලපතිවරයා විසින් උප කුලපති වරයාගේ ධූරයේ කටයුතු ඉටු කළ යුතු ය ;

(ii) නියෝජ්‍ය උප කුලපතිවරයකු නොසිටී නම්, උප කුලපතිවරයාගේ ධූරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙලක්, එකී පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත, කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය.

(10) උප කුලපතිවරයා, ඔහු කලින් ධූරයෙන් ඉවත් වුවහොත් හෝ මේ ඡෙදයෙහි (1) වන අනුඡෙද යේ (ආ) වන වගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ ධූරය දැරීම වෙනත් යම් ආකාරයකින් නතර කළහොත් හෝ නැවත පත් කරනු ලැබුවහොත් මිස, ඔහු උප කුලපතිවරයා වශයෙන් පත් කරු දිනයට පෙරාතුව වූ දිනයේ දී යම් උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් ඒ ආයතනයේ ඔහු දැරූ ස්ථිර තනතුරට ආපසු පත් කරනු ලැබිය හැකි ය. එහෙත් එසේ කළ යුත්තේ ඔහු වයස අවුරුදු හැටපහ සම්පූර්ණ කර නොසිටියහොත් පමණකි.

නියෝජ්‍ය උපකුලපති වරයා.

8. 1984 අංක 1 දරන නියෝජ්‍ය උප කුලපතිවරයා පත් කිරීමේ කාර්ය පටිපාටිය පිළිබඳ නියමාවලියේ විධිවිධානවලට අනුව පාලන සභාව විසින් ස්වකීය අභිමතය පරිදි සහ කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ඇතිව නියෝජ්‍ය උප කුලපතිවරයකු පත් කරනු ලැබිය හැකි ය.

ලේඛකාධිකාරි වරයා.

9. පනතෙහි 37 වන වගන්තියේ විධිවිධාන, '' විශ්වවිද්‍යාලය '' යන යෙදුම යම් තැනක යෙදේ ද ඒ සෑම තැනකම ඒ වෙනුවට '' විවෘත විශ්වවිද්‍යාලය '' යන යෙදුම ආදේශ කිරීමේ වෙනස් කිරීමට යටත්ව, විවෘත විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීවරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදළ විය යුතු ය.

මූල්‍යාධිකාරි වරයා.

10. පනතෙහි 38 වන වගන්තියෙහි විධිවිධාන, '' විශ්වවිද්‍යාලය '' යන යෙදුම යම් තැනක යෙදේ ද ඒ සෑම තැනකම ඒ වෙනුවට '' විවෘත විශ්වවිද්‍යාලය '' යන යෙදුම ආදේශ කිරීමේ වෙනස් කිරීමට යටත්ව, විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරීවරයාට සහ මූල්‍යාධිකාරීවරයා සම්බන්ධයෙන් අදළ විය යුතු ය.

පුස්තකාලයාධිපති වරයා.

11. පනතෙහි 39 වන වගන්තියෙහි විධිවිධාන '' විශ්වවිද්‍යාලය '' යන යෙදුම යම් තැනක යෙදේ ද ඒ සෑම තැනකම ඒ වෙනුවට '' විවෘත විශ්වවිද්‍යාලය '' යන යෙදුම ආදේශ කිරීමේ වෙනස් කිරීමට යටත් විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිවරයා සහ පුස්තකාලයාධිකාරීවරයා සම්බන්ධයෙන් අදළ යුතු ය.

විවෘත විශ්ව විද්‍යාලයේ බල මණ්ඩලය.

12. විවෘත විශ්වවිද්‍යාලයේ බල මණ්ඩල පහත දැක්වේ :—

(අ) පාලක් සභාව ,

(ආ) සනාතන සභාව ;

(ඇ) අධ්‍යයන සභාව හෝ අධ්‍යයන සභා ; සහ

(ඈ) නියමාවලිය මගින් බල මණ්ඩල වශයෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් මණ්ඩල.

පාලක සභාව

13. (1) මෙම නියමාවලියෙහි '' පාලක සභාව '' යනුවෙන් සඳහන් කරනු ලබන විවෘත විශ්ව විද්‍යාලයේ පාලක සභාව විවෘත විශ්වවිද්‍යාලයේ විධායක මණ්ඩලය සහ පාලක බල මණ්ඩලය වන්නේ ය.

(2) පාලක සභාව පහත සඳහන් තැනැත්තන් ගෙන් සමන්විත වන්නේ ය :—

(i) උප කුලපතිවරයා ;

(ii) නියෝජ්‍ය උප කුලපතිවරයකු වෙතොත් ඒ නියෝජ්‍ය උප කුලපතිවරයා ;

(iii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(iv) සනාතන සභාව විසින් එහි සාමාජිකයන් අතුරින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙක් ;

(v) පනතේ 124 වන වගන්තිය යටතේ පිහිටුවන ලද උප කුලපතිවරයන්ගේ සහ අධ්‍යක්ෂ වරයන්ගේ කමිටුව විසින් නම් කරනු ලබන උප කුලපතිවරයෙක් ;

(vi) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ නාමිකයා ;

(vii) ගුවන් විදුලි විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ නාමිකයා ;

(viii) ඉහත සඳහන් (i), (ii), (iii) (iv) සහ (v) වන වගන්තිය යටතේවූ මුළු සාමාජික සංඛ්‍යාවට එකක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවට සමාන සාමාජික සංඛ්‍යාවක් : ඒ සාමාජිකයන් සියලු දෙනාම අධ්‍යාපන, වෘත්තිය, වාණිජ, කාර්මික විද්‍යා හෝ පරිපාලන ක්ෂෙත්‍රයන්හි විශිෂ්ඨ සේවාවක් ඉටුකර ඇති තැනැත්තන් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කළ යුතු ය.

(3) පාලක සභාවට සහ පාලන සභාව සම්බන්ධයෙන් පනතේ 44 වන වගන්තියේ (2) වන, (3) වන, (4) වන, (5) වන, (6) වන, (7) වන, (8) වන, සහ (9) වන උප වගන්තිවල විධිවිධාන අදාළ වන්නේ ය.

පාලක සභාවේ කාර්ය සහ කර්තව්‍ය.

14. (1) පනතෙහි හා මෙම නියමාවලියෙහි විධිවිධානවලට යටත්ව මේ නියමාවලියේ 4 වන ඡෙදය යටතේ විවෘත විශ්ව විද්‍යාලය වෙත පවරා ඇති හෝ නියම කොට ඇති හෝ භාරකොට ඇති බලතල කාර්ය හා කර්තව්‍ය පාලක සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) (i) වන ඡෙදයෙන් පාලක සභාව වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත සඳහන් බලතල කාර්ය හා කර්තව්‍ය පාලක සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(i) විවෘත විශ්ව විද්‍යාලයේ දේපළ සහ අරමුදල් සතුව, සිටීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ;

(ii) විවෘත විශ්ව විද්‍යාලය සඳහා කුල ලාංඡනයක් තෝරා ගැනීම සහ විවෘත විශ්ව විද්‍යාලයේ පොදු මුද්‍රාවෙහි ආකෘතිය නිශ්චය කිරීම, එහි භාරය සඳහා විධිවිධාන සැලැස්වීම සහ එහි භාවිතය මෙහෙයවීම ;

(iii) විවෘත විශ්ව විද්‍යාලයට සම්බන්ධ සියලු කාරණා, පනතෙහි සහ මේ නියමාවලියෙහි සහ යම් උචිත සාධක පත්‍රයක විධිවිධානවලට අනුකූලව විධිමත් කිරීම හා නිශ්චය කිරීම ;

(iv) නිශ්චිත කාර්යයන් සඳහා විවෘත විශ්ව විද්‍යාලයට කැමැත්තක් කර ගැනීමට සපයන ලද යම් අරමුදලක් පරිපාලනය කිරීම ;

(v) අන්තිම කැමති පත්‍රයක් මඟින් පරිත්‍යාග මඟින් සහ ප්‍රදාන මඟින් විවෘත විශ්ව විද්‍යාලය වෙත පවරනු ලබන දේපළ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව භාර ගැනීම සහ පිළිගැනීම ;

(vi) විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගණන් සලකා බැලීම සහ අවශ්‍ය වේ නම්, ඒවා සංශෝධනය කිරීම හා පිළිගැනීම සහ ඒ වාර්තා සහ ඒ ගණන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(vii) විවෘත විශ්ව විද්‍යාලයේ මුදල් ඇස්තමේන්තුපිළියෙළ කිරීම හා ඒ ඇස්තමේන්තු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(viii) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන්ද ඒ කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීම ;

(ix) විවෘත විශ්ව විද්‍යාලයේ වෙනත් යම් බල මණ්ඩලයක් විසින් සෑදිය යුතු බවට විධිවිධාන සලස්වා නොමැති නියෝග සෑදීම ;

(x) විවෘත විශ්ව විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, භූමිභාග, ලී බඩු, උපකරණ හා වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(xi) විවෘත විශ්ව විද්‍යාලයේ සේවය සඳහා තැනැත්තන් පත් කිරීම හා ඔවුන්ගේ සේවය තාවකාලිකව නතර කිරීම, ඔවුන් සේවයෙන් පහ කිරීම හෝ වෙනත් ආකාරයකින් ඔවුන්ට දඬුවම් කිරීම ; එසේ වුවද, නිලධරයන් හා ආචාර්යවරයන් සම්බන්ධයෙන් වූ විට හැර, මේ බලතල උප කුලපතිවරයා වෙත පවරනු ලැබිය හැකිය.

(xii) සනාතන සභාවේ නිර්දේශ සලකාබැලීමෙන් පසු විවෘත විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලයෙන් හෝ ඉන් බැහැරින් හෝ පරීක්ෂක වරයන් පත් කිරීම හා ඒ පරීක්ෂකවරයන්ට ගෙවනු ලබන ගාස්තු නිශ්චය කිරීම.

(xiii) විවෘත විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ සාමාන්‍ය ශුභ සිද්ධිය නංවාලීම සඳහා (සංයුතිය බලතල, කාර්ය සහ කර්තව්‍ය අතුරු ව්‍යවස්ථා මඟින් නියම කරනු ලැබිය යුතු වන්නා වූ) ශුභ සාධක මණ්ඩලයක් පත් කිරීම.

(xiv) විවෘත විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම, පර්යේෂණ කටයුතු සහ ව්‍යාප්ත කිරීමෙ වැඩ පිළිවෙල වල් නංවාලීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් පීඨ සහ අධ්‍යාපන අංශ පිහිටුවීම සම්බන්ධයෙන් සනාතන, සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාවට උපදෙස් දීම ;

(xv) එවකට පවත්නා අධ්‍යාපන අංශ ප්‍රතිසංවිධානය කිරීම සහ අලුත් අධ්‍යාපන අංශ සංවිධානය කිරීම් සම්බන්ධයෙන් සනාතන සභාවේ වාර්තා සලකා බැලීමෙන් පසු ඒ පිළිබඳව කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(xvi) විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනික තාක්ෂණය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා සහ විවෘත විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් සඳහා සුදුසු අධ්‍යාපනික කරුණු සම්පාදනය කිරීම සඳහා (සංයුතිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය, අතුරු ව්‍යවස්ථා මඟින් නියම කරනු ලැබිය යුතු) අධ්‍යාපනික තාක්ෂණ මණ්ඩලයක් පත් කිරීම ;

(xvii) ප්‍රාදේශිය අධ්‍යාපන සේවා සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා (සංයුතිය, බලතල කාර්ය සහ කර්තව්‍ය, අතුරු ව්‍යවස්ථා මඟින් නියම කරනු ලැබිය යුතු) ප්‍රාදේශීය අධ්‍යාපන සේවා මණ්ඩලයක් පත් කිරීම ;

(xviii) විවෘත විශ්ව විද්‍යාලය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළත්වීම, ඒ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම හෝ අවලංගු කිරීම සහ ප්‍රයෝජනයට නොයොදා ඇති යම් ආදායමක් ද ඇතුළුව විවෘත විශ්ව විද්‍යාලයට අයත් කවර මුදලක් වුව ද, භාර ආඥා පනතේ 20 වන වගන්තියේ හෝ වෙනත් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ මුදල් නීත්‍යානුකූලව ආයෝජනය කළ හැකි යම් සුරැකුම් පතක ආයෝජනය කිරීම නැතහොත් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිළට ගැනීම සඳහා එවැනි යම් මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම් සඳහා වහාම අවශ්‍ය නොවන යම් කොටසක් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කිරීම ;

(xix) විවෘත විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයාගේ, නිළධරයන්ගේ, උපාධිධාරීන්ගේ සහ ශිෂ්‍යයන්ගේ උපාධි නෝපාධ්‍යාය හෝ ලාංඡනය හෝ ඒ දෙකම සනාතන සභාව විමසීමෙන් පසු නිශ්චය කිරීම ;

(xx) සනාතන සභාව විමසීමෙන් පසු අධ්‍යයන වැඩ සටහන්වලට හෝ අධ්‍යයන පාඨමාලා වලට ශිෂ්‍යයන් ඇතුල්කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම ;

(xxi) කොමිෂන් සභාවට පහත දැක්වෙන දේ පිළිබඳව උපදෙස් දීම :—

(අ) සනාතන සභාව විමසීමෙන් පසු මහාචාර්යය ධුර, සහාය මහාචාර්යය ධුර, කථිකාචාර්යය ධුර හා වෙනත් යම් අධ්‍යයන තනතුරක් ඇති කිරීම, නැති කිරීම හෝ අත්හිටුවීම ;

(ආ) අධ්‍යයන තනතුරක් ඇති කිරීම, නැති කිරීම හෝ අත්හිටුවීම ; සහ

(ඇ) විවෘත විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයන්ගේ, නිලධරයන්ගේ හා වෙනත් සේවකයන්ගේ, සුදුසුකම් ; සහ

(xxii) ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් පනතෙහි මේ නියමාවලියෙහි හෝ යම් උචිත සාධක පත්‍රයක හෝ අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා නොමැති විවෘත විශ්ව විද්‍යාලයේ අනිකුත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම,

එසේ වුව ද, සනාතන සභාවේ මතය පාලක සභාව වෙත වාර්තා කිරීමේ හා යැවීමේ අවස්ථාවක් සනාතන සභාවට ප්‍රථමයෙන් දී ඇත්තේ නම් මිස, යම් අධ්‍යයන කාරණයක් සම්බන්ධයෙන් පාලක සභාව විසින් කිසිම යෝජනාවක් සම්මත කර නොගත යුතු ය.

මෙ අකුරු වගන්තියේ " අධ්‍යයන කාරණය " යන්නෙන් සනාතන සභාවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් යම් කාරණයක් අදහස් වේ.

15. (1) මෙම නියමාවලියෙහි ' සනාතන සභාව ' යනුවෙන් සඳහන් කරනු ලබන විවෘත විශ්ව විද්‍යාලයේ සනාතන සභාව, විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යයන බල මණ්ඩලය විය යුතුය. සනාතන සභාව

(2) සනාතන සභාව පහත දැක්වෙන තැනැත්තන්ගෙන්සමන්විත විය යුතුය —

(i) උප කුලපතිවරයා ;

(ii) නියෝජ්‍ය උපකුලපතිවරකු සිටිනම් ඔහු ,

(iii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(iv) අධ්‍යයන තාක්ෂණික අධ්‍යක්ෂවරයා ,

!v) එක් එක් අධ්‍යාපන අංශයේ ප්‍රධානියා ,

(vi) විශ්ව විද්‍යාලයේ සෑම ස්ථිර මහාචාර්යවරයාම ,

(vii) පුස්තකාලයාධිපතිවරයා , සහ

(vii) එක් එක් පීඨයේ ස්ථිර ආචාර්යවරුන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කරනු ලැබූ මේ අනුඡෙදයේ ඉහත වගන්තිවල සඳහන් තැනැත්තන් නොවන ආචාර්යවරුන් දෙදෙනෙක්.

(3) එක් එක් පීඨයේ ස්ථිර ආචාර්යවරුන් විසින්, තමන් අතුරින් තෝරා පත් කර ගනු ලැබූ ආචාර්ය වරුන් දෙදෙනා ඔවුන් තෝරා ගනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් ධුරය දැරිය යුතුය. එසේ වුවද එසේ තෝරා පත් කර ගනු ලැබූ යම් ආචාර්යවරයකු ධුරයෙන් විශ්‍රාම ගතහොත් හෝ ඉල්ලා අස්වුවහොත් හෝ සනාතන සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිනීම නිසා හෝ ධුරය හිස් කළහොත්, (2) වන අනුඡෙදයේ (viii) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, ඒ සාමාජිකයා වෙනුවට වෙනත් සාමාජිකයෙකු තෝරා පත් කරගනු ලැබිය යුතුය. එසේ පත්කර ගනු ලබන ආචාර්යවරයා කලින් ධුරය හිස් කළහොත් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ශේෂ වී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතුය.

(4) සනාතන සභාවේ රැස්වීමක ගණපූරණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව එහි සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකි.

(5) විවෘත විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ සහ විභාග පිළිබඳ පාලනය සහ සාමාන්‍ය මෙහෙයවීම සනාතන සභාව සතු වේ.

(6) පනතේ සහ මේ නියමාවලියේ විධිවිධානවලට යටත්ව සහ (5) වන අනුඡෙදයෙන් සනාතන සභාව වෙත පවරනු ලැබූ බලතල වලට ව්‍යාප්තියට හානියක් නොමැතිව, සනාතන සභාව විසින් පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍ය සිදු කිරීම කළ යුතු ය:—

(i) අදළ පීඨ මණ්ඩලයේ හෝ පීඨ මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසු අධ්‍යයන වැඩ සටහන්වලට හෝ අධ්‍යයන පාඨමාලාවලට සහ විභාගවලට අදළ නියෝග, කෙටුම්පත් කිරීම සහ පාලක සභාවේ අනුමතිය සඳහා ඒ කෙටුම්පත් ඉදිරිපත් කිරීම ,

(ii) අදළ පීඨ මණ්ඩලයේ හෝ පීඨ මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසු පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීමට සුදුසු තැනැත්තන්ගේ නම් පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(iii) විවෘත විශ්ව විද්‍යාලයේ මහාචාර්ය, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය පාලක සභාව සහ වෙනත් ශාස්ත්‍රීය තනතුරු ඇති කිරීම, නැති කිරීම හෝ අත්හිටුවීම වෙත නිර්දේශ කිරීම ;

(iv) අදළ පීඨ මණ්ඩලයේ හෝ පීඨ මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසු :—

(අ) පවත්නා පීඨ සහ අධ්‍යාපන අංශ ප්‍රතිසංවිධානය කිරීමේ සහ අලුත් පීඨ හා අධ්‍යාපන අංශ සංවිධානය කිරීමේ යෝජනා ක්‍රම ; සහ

(ආ) අධ්‍යාපන අංශ ඒ ඒ අදල පීඨවලට පවරාදීම පිළිබඳව පාලක සභාව වෙත නිර්දේශ කිරීම ,

(v) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, පාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග සඳහා සුදුසුකම් ලැබීමෙහි ලා සපුරාලිය යුතු නියමයන් පාලක සභාවට නිර්දේශ කිරීම ;

(vi) පාලක සභාව විසින් අනුමත කරනු ලබන යම් කොන්දේසි වේ ද, ඒ කොන්දේසි මත අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, පාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම ;

(vii) සනාතන සභාවට සුදුසුයයි පෙනී යන ප්‍රමාණයක සනාතන සභාවේ ස්ථාවර කමිටු හෝ තත් කාර්ය කමිටු හෝ මණ්ඩල පත් කිරීම සහ විශේෂයෙන්ම ,—

(අ) පුස්තකාල කමිටුවක් ;

(ආ) ශිෂ්‍යයන් ඇතුල්කර ගැනීමේ කමිටුවක් ;

(ඇ) පර්යේෂණ කමිටුවක් ;

(ඈ) විෂයමාලා සහ ඇගැයීමේ කමිටුවක් ; සහ

(ඉ) පරිවාස අධ්‍යයන නිවාඩු කමිටුවක් ; පත් කිරීම සහ ඒවායේ විෂය කරුණු නියම කිරීම සඳහා ඒ කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් ඇතිව හෝ නැතිව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂෙප කිරීම ;

(viii) අධ්‍යයන වැඩ සටහන්වලට ශිෂ්‍යයන් ඇතුල් කරවා ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම් පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(ix) ඒ ඒ විෂය ක්ෂෙත්‍රයන් සඳහා පාඨමාලා කණ්ඩායම් පත් කිරීම ගැන පාලක සභාවට නිර්දේශ කිරීම ; සහ

(x) විවිධ අධ්‍යයන පාඨමාලා සඳහා වූ අධ්‍යාපනික තාක්ෂණ ක්‍රම සම්බන්ධයෙන් අධ්‍යාපනික තාක්ෂණ මණ්ඩලයේ යෝජනා සලකා බැලීම සහ පාලක සභාවේ අනුමතය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන එවැනි ක්‍රම නිර්දේශ කිරීම.

16. (1) විවෘත විශ්ව විද්‍යාලයේ පහත දැක්වෙන පීඨ තිබිය යුතුය :—

(අ) මානව හා සමාජ විද්‍යා පීඨය ;

(ආ) ස්වභාවික විද්‍යා පීඨය, සහ

(ඇ) ඉංජිනේරු තාක්ෂණ පීඨය.

(2) මානව හා සමාජ විද්‍යා පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යාපන අංශ තිබිය යුතුය :—

(i) අධ්‍යාපනය ;

(ii) නීති අධ්‍යාපනය ;

(iii) භාෂා අධ්‍යාපනය ;

(iv) කළමණාකරණ අධ්‍යාපනය ;

(v) සමාජ විද්‍යා අධ්‍යාපනය, සහ

(vi) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් ඕනෑම අංශයන්.

(3) ස්වභාවික විද්‍යා පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යාපන අංශ තිබිය යුතු ය :—

(i) ගණිතය ;

(ii) රසායන විද්‍යාව ;

(iii) භෞතික විද්‍යාව ;

(iv) සත්ව විද්‍යාව ;

(v) උද්භිද විද්‍යාව ; සහ

(vi) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් ඕනෑම අංශයන්.

(4) ඉංජිනේරු තාක්ෂණ පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යාපන අංශ තිබිය යුතුය :—

(i) සිවිල් ඉංජිනේරු විද්‍යාව ;

(ii) විදුලි සහ පරිඝණක ඉංජිනේරු විද්‍යා ;

(iii) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා ;

(iv) පරිඝණක අධ්‍යාපනය ;

(v) පේෂකර්ම තාක්ෂණ විද්‍යාව ; සහ

(vi) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් ඕනෑම අංශයන්.

අධ්‍යාපන අංශයක ප්‍රධානයා

(5) උප කුලපතිවරයාගේ නිර්දේශය පිට පාලක සභාව විසින් පත්කරනු ලබන මාහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක් හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක්, අධ්‍යාපන අංශයක ප්‍රධානයා වන්නේ ය.

එසේ වුව ද, පාලක සභාව විසින් අධ්‍යාපන අංශයේ ප්‍රධානයා පත් කරනු නොලැබූ අවස්ථාවක, තමාගේ පත් වීමේ දින සිට ගණන් බලන ලද මාස එකකට නොවැඩි කාලයක් සඳහා අංශයක ප්‍රධානයාගේ ධුරයේ කටයුතු කිරීමට උප කුලපතිවරයා විසින්, මහාචාර්යවරයෙකු, සහාය මාහාචාර්යවරයෙකු, හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු පත් කරනු ලැබිය හැකි ය.

(6) අංශයක ප්‍රධානයා, යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන වලට යටත්ව, කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් ධුරය දරන අතර නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

(7) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා තුන් මසකට නොවැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට අංශයක ප්‍රධානයාට තාවකාලිකව නොහැකි වුවහොත් ඒ කාලය තුළ ඒ ධුරයේ කටයුතු කිරීමට උප කුලපතිවරයා විසින් ඒ අංශයේ වෙනත් මාහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු පත් කළ යුතු ය. එසේ වුව ද අංශයක ප්‍රධානයකු විශ්‍රාම ගන්නා විට හෝ ඉල්ලා අස්වන විට හෝ වෙනත් හේතුවක් නිසා තුන් මසකට වැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට ඔහුට නොහැකි වූ විට, අංශයේ ප්‍රධානයාගේ ධුරය පුරප්පාඩු වූ ලෙස සැලකිය යුතු අතර (5) වන අනු ඡෙදය අනුව අංශයේ නව ප්‍රධානයකු පත් කළ යුතුය.

පීඨයෙහි පීඨාධිපති වරයා

17. (1) විවෘතවිශ්ව විද්‍යාලයේ පූර්ණකාලීන නිළධරයකු හා පීඨයේ ශාස්ත්‍රීය සහ පරිපාලන ප්‍රධානයා විය යුතු පීඨාධිපතිවරයකු එක් එක් පීඨයෙහි විය යුත්තේය. පීඨ මණ්ඩලයේ මාහාචාර්යවරයන්, සහාය මාහාචාර්යවරයන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් පීඨ මණ්ඩලය විසින් පීඨාධිපතිවරයා තෝරා ගත යුතුය.

(2) පීඨයක පීඨාධිපතිවරයා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ඔහු තෝරා පත්කර ගනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස, නැවත තෝරා පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේය.

(3) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා තුන් මසකට නොවැඩි කාලයක් තම ධුරයෙන් කටයුතු කිරීමට පීඨයක පීඨාධිපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත්, ඒ කාලය තුළ පීඨාධිපති ධුරයේ කටයුතු කිරීමට උප කුලපතිවරයා විසින් ඒ පීඨයේ මාහාචාර්යවරයන්, සහාය මාහාචාර්ය වරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය;

එසේ වුවද පීඨයක පීඨාධිපතිවරයකු විශ්‍රාම ගන්නා විට හෝ ඉල්ලා අස්වනවිට හෝ වෙනත් හේතු වක් නිසා තුන් මසකට වැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට ඔහුට නොහැකි වූ විට, ඒ පීඨයේ පීඨාධිපති ධුරය පුරප්පාඩු වූ ලෙස සලකනු ලැබිය යුතු අතර (1) වන අනුඡෙදයට අනුව නව පීඨාධිපතිවරයකු පත් කරනු ලැබිය යුතුය.

විවෘත විශ්ව විද්‍යාලයේ පීඨවල සංයුතිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය

18. (1) විවෘතවිශ්ව විද්‍යාලයේ එක් එක් පීඨය මේ නියමාවලිය යටතේ එය වෙත පවරනු ලැබිය හැකි අධ්‍යාපන අංශවලින් සමන්විත විය යුතු ය.

(2) විවෘත විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨය සඳහා පහත දැක්වෙන තැනැත්තන් ගෙන් සමන්විත වූ පීඨ මණ්ඩලයක් තිබිය යුතු ය :—

(i) තත් පීඨයේ පීඨාධිපති ;

(ii) අධ්‍යාපනික තාක්ෂණ අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(iii) ඒ පීඨය සමන්විත වන්නා වූ අධ්‍යාපන අංශවල සියලුම ස්ථිර මහාචාර්යවරු, සහාය මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු සහ කථිකාචාර්යවරු;

(iv) පීඨයේ ස්ථිර සහකාර කථිකාචාර්යවරුන් විසින් ඔවුන් අතුරෙන් තෝරා පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(v) ඉහත (iii) සහ (iv) යන වගන්තිවල සඳහන් අය බැහැර කොට පීඨයේ ඉගැන්වීමේ කටයුතුවල නිරත ස්ථිර කාර්ය මණ්ඩලය විසින් ඔවුන් අතුරෙන් තෝරා පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ; සහ

(vi) පීඨයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයක් දරන්නා වූ ද විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන්නා වූ ද තැනැත්තන් අතුරින් පීඨ මණ්ඩලය විසින් තෝරා පත්කර ගන්නා අවම වශයෙන් තිදෙනෙකුට නොඅඩුවූ ද පස් දෙනෙකුට නොවැඩි වූ ද තැනැත්තන් සංඛ්‍යාවක් ;

(3) පනතේ සහ මේ නියමාවලියේ විධිවිධානවලට යටත්ව, පීඨ මණ්ඩලයක් විසින් පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(i) සනාතන සභාව විසින් පීඨ මණ්ඩලය වෙත යොමු කරනු ලබන යම් කාරණයක් සලකා බැලීම හා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම ;

(ii) සනාතන සභාවේ පාලනයට යටත්ව, පීඨයේ අධ්‍යාපන අංශවල ඉගැන්වීම, විභාග පැවැත්වීම, සහ පර්යේෂණවලට සම්බන්ධ කටයුතු විධිමත් කිරීම ;

(iii) පීඨයේ අධ්‍යාපන අංශවලට සහ විභාගවලට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් සනාතන සභාව වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම ;

(iv) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් ගැන සලකා බලා වාර්තා කිරීමේ කාර්යය සඳහා පීඨයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත් කිරීම ; සහ

(v) විභාග පරීක්ෂකවරයන් වශයෙන් පත් කිරීමට සුදුසු තැනැත්තන් සනාතන සභාව වෙත නිර්දේශ කිරීම.

4) පීඨයේ පීඨාධිපති පීඨ මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මුලසුන දරන්නේ ය.

**අතුරු ව්‍යවස්ථා**

19. විවෘත විශ්වවිද්‍යාලයේ පාලන බල මණ්ඩලය විසින් අතුරු ව්‍යවස්ථා සාදනු ලැබීමට සහ ඒ සම්බන්ධයෙන්, පනතේ 135 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**නියෝග**

20. විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් නියෝග සාදනු ලැබීමට සහ ඒ සම්බන්ධයෙන්, පනතේ 136 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**රීති**

21. විවෘත විශ්වවිද්‍යාලයේ යම් බල මණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් රීති සාදනු ලැබීමට සහ ඒ සම්බන්ධයෙන්, පනතේ 137 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**විවෘත විශ්ව විද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය**

22. (1) සෑම වර්ෂයකටම වරක්, කුලපතිවරයා විසින් අනුමත කරනු ලබන දිනයක දී හෝ දිනවල දී, උපාධි පිරිනැමීමේ කාර්යය සඳහා උපාධි ප්‍රදානෝත්සවයක් විවෘත විශ්වවිද්‍යාලය විසින් පැවැත්විය යුතු ය.

එසේ වුව ද කුලපතිවරයා විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් වේලාවක දී විවෘත විශ්වවිද්‍යාලය විසින් විශේෂ උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබිය හැකි ය:

එසේම තවදුරටත්, උපාධි ප්‍රදානෝත්සවයක් නොපවත්වා පළමු උපාධි පිරිනැමීම කරනු ලැබිය හැකි ය.

(2) උපාධි ප්‍රදානෝත්සවයක කාර්ය පරිපාටිය ක්‍රමය හා ආකාරය අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය යුතු ය.

(3) ජනාධිපතිවරයා පැමිණ සිටින අවස්ථාවක දී ජනාධිපතිවරයා විසින් උපාධි ප්‍රදානෝත්සවයක මුලසුන දැරිය යුතුය. ඔහු පැමිණ නොසිටින අවස්ථාවලදී කුලපතිවරයා විසින් මුලසුන දැරිය යුතු අතර, ජනාධිපතිවරයා සහ කුලපතිවරයා යන දෙදෙනාම පැමිණ නොසිටින අවස්ථාවලදී උප කුලපතිවරයා විසින් එම උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරිය යුතු ය.

23. විවෘත විශ්වවිද්‍යාලයට අදාළ යම් කාරණයක් සම්බන්ධයෙන් මේ නියමාවලියෙන් විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක දී, පනතේ ඊට අදාළ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ කාරණය සඳහා ඒ කාරණය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

අර්ථ නිරූපණය

මේ නියමාවලියෙන් විධිවිධාන සලස්වා නොමැති කාරණා සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අදාල විය යුතු බව.

24. මේ නියමාවලියෙහි —

'පනත' යන්නෙන් 1985 අංක 7, 1988 අංක 24, 1988 අංක 26, 1988 අංක 33 සහ 1989 අංක 03 දරන විශ්වවිද්‍යාල සංශෝධන පනත් වලින් සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත අදහස් වේ ;

'උචිත සාධන පත්‍රය' යන්නෙන් පනතේ විධිවිධානවලට හෝ මේ නියමාවලියේ විධිවිධාන වලට අනුකූලව සාදන ලද යම් නියමයක්, නියමාවලියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝග යක් හෝ රීතියක් අදහස් වේ ;

'කොමිෂන් සභාව' යන්නෙන් පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ ;

'ජනාධිපතිවරයා' යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ.

1—287.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.